# සල්ගල අරණ්‍ය සේනාසනය ආශ්‍රිත උරුම කළමනාකරණය

එම්. ආර්. එන්. ජයසිංහ[1], කේ. කේ. එච්. එම්. ගුණවර්ධන[2],
එච්. ඒ. එස්. එන්. ජයරත්න[3]

## හැඳින්වීම

උරුම කළමනාකරණය යන්නෙහි සරල අදහස වන්නේ යම් පුරාවිද්‍යාත්මක උරුම ස්ථානයක් හෝ වේවා ස්වාභාවික උරුම ස්ථානයක් හෝ වේවා එම ස්ථානයේ පවතින අගයන් ආරක්ෂා කරමින් අනාගතය කරා රැගෙන යාම සඳහා කරනු ලබන යම් ක්‍රමවේදයකි. සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලපිටමඩ ප්‍රදේශයට මායිම්ව සල්ගල ග්‍රාමයේ පිහිටා ඇති සල්ගල අරණ්‍ය සේනාසනය එවැනි ආරක්ෂා කර ගත යුතු උරුමයකි. වරකාපොල සිට අඟුරුවාකන්ද මාර්ගය හරහා සැතපුම් 7ක් පමණ ද ගලපිටමඩ සිට සැතපුම් 7ක් පමණ ද ගමන් කිරීමෙන් සල්ගල අරණ්‍ය සේනාසනයට ළඟාවිය හැකිය. අගයයන් කිහිපයක් මත සුවිශේෂි වන්නා වූ සල්ගල අරණ්‍යය සේනාසනයේ අගයන් ආරක්ෂා කරමින් ශ්‍රී ලංකාවේ පවතින බෞද්ධ උරුමයක් වශයෙන් අනාගතය වෙත පවත්වාගෙන යන්නේ කෙසේද යන ගැටලුව මත මෙම පර්යේෂණය සිදු කරන ලදි. ඒ අනුව අරණ්‍යය සේනාසනය ආශ්‍රිතව උරුම කළමනාකරණ සැලැස්මක් සකස්කර අරණ්‍යය සේනාසනයේ අගයන් ආරක්ෂා කරමින් අනාගතය වෙත පවත්වාගෙන යාමට යෝජනා කිරීම මෙහි දී සිදු කෙරේ.

## ක්‍රමවේදය

සල්ගල අරණ්‍යය සේනාසනය පිළිබඳ පර්යේෂණය සිදුකරගත යාමේ දී ක්ෂේත්‍ර නොවන අධ්‍යයනයක් මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයනයක් ද සිදුකරන ලදි. ක්ෂේත්‍ර අධ්‍යයනයන් වශයෙන් සල්ගල අරණ්‍යය සේනාසනයට ගොස් තොරතුරු රැස් කළේ ය. එහි දී විහාරාධිපති ස්වාමීන් වහන්සේ සමග හා ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මහතා සමඟ සාකච්ඡා කොට දත්ත රැස්කිරීම කළ අතර සල්ගල අරණ්‍යය සේනාසනයේ ලෙන් සහිත භූමිය පුරා ඇවිද ඒවායේ ඡායාරූප ආදිය ලබාගනිමින් දත්ත රැස්කළේ ය. ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය හරහා පුස්තකාල පරිශීලනය සිදුකරන ලදි. ලබාගත් දත්ත ආශ්‍රයෙන් පියවර පහක් යටතේ මෙම උරුම කළමනාකරණ සැලැස්ම සකස්කරමින් පර්යේෂණය සිදු කළ අතර එහි පළමු

[1] උපාධි අපේක්ෂක, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ranginadeesha90@gmail.com
[2] උපාධි අපේක්ෂක, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
[3] උපාධි අපේක්ෂක, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

පියවර යටතේ අගයයන් හඳුනාගැනීම සිදු කළේ ය. ඒ අනුව ඓතිහාසික අගය, ආර්ථික හා භාවිතාමය අගය, වාස්තු විද්‍යාත්මක හා කලාත්මක අගය, පාරිසරික හා සෞන්දර්යාත්මක අගය, විද්‍යාත්මක අධ්‍යාපනික අගය, සමාජීය හා ආධ්‍යාත්මික අගය වශයෙන් අගයයන් කීපයක් හඳුනාගත් අතර දෙවන පියවර යටතේ එම අගයයන් ආරක්ෂා කරගැනීමට ප්‍රතිපත්ති සකස්කිරීමත් තෙවන පියවර යටතේ ප්‍රතිපත්ති සඳහා උපක්‍රම සකස්කිරීමත් සිව්වැනිව ඒවා ක්‍රියාවන් බවට පත්කර පස්වන පියවර යටතේ ඇගයීම් හා පසු විපරම් කර උරුම කළමනාකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කරමින් සල්ගල අරණ්‍යය සේනාසනය අනාගතය වෙත පවත්වාගෙන යාම මින් සිදු කෙරේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

අක්කර 600 ක් තරම් භූමි ප්‍රමාණයක් සහිත අරණ්‍යය සේනාසනයක නටඹුන් දැකිය හැකි හා ලෙන් 18 කින් යුතුවන සුන්දර වනපියසකින් යුක්ත සල්ගල අරණ්‍ය සේනාසනය ඓතිහාසික යුගයේ පටන් නූතන යුගය දක්වා මානව ක්‍රියාකාරකම් සිදු වූ භූමියකි. අනුරාධපුර අවධියේ දී මෙම ලෙන් සහිත භූමිය භික්ෂූන් වහන්සේලා වැඩවිසූ පුදබිමක් වශයෙන් භාවිත කර ඇත. මෙහි ඇති ලෙන් ලිපියකින් ද මේ බැව් තහවුරු වේ ("බත දම ගුත ලෙන"). මෙම භූමියෙහි ඓතිහාසික අගය ආරක්ෂා කිරීම සඳහා අප යෝජනා කීපයක් තෙවන පියවර යටතේ ඉදිරිපත් කරනු ලැබීය. අදාළ පුරාවිද්‍යා භූමියේ සීමාවන් වෙන වෙන ම හඳුනාගැනීම, ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම, සංරක්ෂණය හා ක්‍රමවත් නඩත්තුවක් පවත්වාගෙන යාම, ස්මාරක ආරක්ෂා කිරීමට යෝජනා කෙරේ. මෙහි දැනට පවතින ආර්ථික හා භාවිතාමය අගය ආරක්ෂා කිරීම සඳහා ප්‍රදේශයේ දැනට පවතින සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට බලාපොරොත්තු වේ. ඒ අනුව ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය සංවර්ධනය කිරීම, අරණ්‍ය සේනාසනය පිළිබඳවිවිස්තර ඇතුළත් පොත්පත් හා සංයුක්ත තැටි අළෙවි කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, සංචාරක ව්‍යාපාරය නඟාසිටුවීම යන යෝජනා ඉදිරිපත් කිරීම හරහා ආර්ථික අගය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. අරණ්‍යය සේනාසනයේ යුග කිහිපයකම වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් පවතී. වරිච්චි බිත්ති සහිත කටාරම් කෙටූ ලෙන්වලින් මුල්කාලීන යුගයේ වාස්තු විද්‍යාව පෙන්නුම් කෙරේ. පැරණි ලෙන් අතුරින් "පිප්පලී හා ගිජ්ජකූට" ලෙන් ද්විත්වය සුවිශේෂී වේ. මෙම ලෙන් පද්ධතියේ ඇති විශාලතම ලෙන තුළින් වළගම්බා රජුගේ ඇතු බැඳ තැබීමට භාවිත කළ බවට සාධක ලැබේ. ලෙන් පද්ධතියට මඳක් නුදුරින් පැරණි කුඩා වැව් ද්විත්වයක ශේෂයන් දැකිය හැකි ය. වළගම්බා රජ සමයේ සතුරන්ගෙන්

ආරක්ෂා වීම උදෙසා ඔත්තු බැලීමට යොදාගත් බවට විශ්වාස කෙරෙන බැලුම් ගල අරණ්‍යයේ ඉහළම ස්ථානයේ පිහිටා තිබේ. ලෙනගල පුරාණ ලෙන් විහාරය හා සම්බන්ධ වන බව කියැවෙන උමඟක නටඹුන් ද මින් හමුවේ. මෙවැනි වාස්තු විද්‍යාත්මක හා පුරාවිද්‍යාත්මක අගයන් ආරක්ෂා කිරීම සඳහා උපක්‍රම කිහිපයක් වශයෙන් ලෙන් ආරක්ෂා කිරීම, වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් ආරක්ෂා කිරීම, ප්‍රතිසංස්කරණ හා නඩත්තු කිරීම, අනවශ්‍ය ඉදිකිරීම් ඉවත් කිරීම යන යෝජනා ඉදිරිපත් කරමින් පවතින ඉදිකිරීම් හා නටඹුන් ආරක්ෂා කිරීමට අදහස් කෙරේ. සල්ගල අරණ්‍යය සේනාසනයේ වනපියසෙහි ප්‍රදේශයට ආවේනික ශාක හා සත්ත්ව විශේෂ කිහිපයක් ම දක්නට ලැබේ. පොදුවේ මෙම සත්ත්ව විශේෂ 250 ක් පමණ දැකිය හැකිය. එහි සමනළ විශේෂ, කුරුලු වර්ග, මත්ස්‍ය විශේෂ හඳුනාගෙන ඇත. වටහැට ගහ යනුවෙන් හඳුන්වන යෝධ වෘක්ෂය මෙහි දැකිය හැක. මෙවැනි පාරිසරික හා සෞන්දර්යාත්මක වශයෙන් ඉහළ අගයක් පවතින්නා වූ මෙම විහාරස්ථානය වන පියස ආරක්ෂා කර ගැනීම සඳහා සත්ත්ව හා ශාක විශේෂ ආරක්ෂා කිරීම, පාරිසරික හා භූ භෞතික තත්ත්වය ආරක්ෂා කිරීම වශයෙන් උපක්‍රම ඉදිරිපත් කිරීම සිදු කෙරේ. පාසල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන්, පර්යේෂණ කණ්ඩායම් යන පිරිස් මෙම භූමිය පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සිදුකළ අතර විශේෂයෙන් ම කෑගල්ල නගරයට නුදුරින් පිහිටි වනගත ප්‍රදේශයක් වීම හේතුවෙන් තෙත් කලාපීය වනාන්තරයක් වශයෙන් මෙම භූමිය සුරක්ෂිතව පැවතීම නිසා මෙහි වාසය කරන්නා වූ ශාක විශේෂ හා සත්ත්ව විශේෂ පිළිබඳ අධ්‍යයන කිරීමට හැකි වේ. මෙම අධ්‍යාපනික අගය ඉහළ දැමීම සඳහා එම පර්යේෂණ කටයුතු සිදුකරන්නන් හට දැනට පවතින ආකාරයට වඩා පහසුකම් සැලසීම තෙවන පියවරෙහි උපක්‍රමය වශයෙන් ඉදිරිපත් කෙරේ. ප්‍රදේශයේ ජනතාවට වැඳුම් පිදුම් කිරීමට උපකාරී වන මෙම විහාරස්ථාන භූමියේ වැඳුම් පිදුම් කිරීමට අවශ්‍ය භෞතික සම්පත් ගොඩනැගීම උපක්‍රමයක් වශයෙන් යෝජනා කිරීම හරහා මෙහි සමාජීය හා ආධ්‍යාත්මික අගය වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. පර්යේෂණ ක්‍රියාවලියේ දී සිව්වන පියවර යටතේ මතු දැක්වූ උපක්‍රම ක්‍රියාවට නැංවීම සිදුකරන අතර ඒ හරහා මෙම උරුම කළමනාකරණ සැලැස්ම සක්‍රිය ක්‍රියාවලියක් බවට පත්කරන්නේ ය. මේ සඳහා විවිධ පුද්ගලයින්ගේ දායකත්වය ලබාගනිමින් එම ක්‍රියාව සාර්ථක කරගැනීම අපේක්ෂා කරයි. පර්යේෂණයේ පස්වන පියවර යටතේ ඇගයීම් පසුවිපරම් කිරීම සිදුකෙරේ. මෙම ක්‍රියාවලිය හරහා මෙම කළමණාකරණ සැලැස්මේ යම් අඩුපාඩුවක් සිදු වී ඇත්නම් ඒවා නැවත සකස්කර යථාවත් කිරීම හා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති නිසි අයුරින් ක්‍රියාවට නැංවීද යන්න විමර්ශනය කෙරේ. ඇගයීම හා පසුවිපරම කොටස් කිහිපයකට වෙන්කර සිදු කරන අතර ඒ

හරහා කිසිදු මඟහැරීමක් සිදු නොවීමට අදහස් කෙරේ. ඒ අනුව උරුම දේපළ පිළිබඳ පසු විපරම, ඉදිකිරීම් හා යටිතල පහසුකම් ආශ්‍රිත පසු විපරම, සංචාරක කටයුතු ආශ්‍රිත පසු විපරම, පරිසරය ආශ්‍රිත පසු විපරම, ආර්ථික කටයුතු ආශ්‍රිත පසු විපරම වශයෙන් මෙම පියවර දියත් කිරීමට අදහස් කෙරේ. මෙම ආකාරයෙන් සල්ගල අරණ්‍යය සේනාසන භූමිය ආශ්‍රිත උරුම කළමනාකරන සැලැස්මක් සකස් කිරීම හරහා සමාජයේ පවතින උරුම ස්ථානයක් වශයෙන් මෙම විහාරස්ථානය හා ඒ අවට භූමිය අනාගතය කරා පවත්වාගෙන යාමට හැකි වේ.

ප්‍රමුඛ පද : සල්ගල , සුවිශේෂි , අගය , පියවර , උරුම කළමණාකරණය

ආශ්‍රිත ග්‍රන්ථ

සල්ගල පුරාණය. (2009). *සල්ගල ආරණ්‍ය සේනාසනය.* ගලපිටමඩ.